## කපුගේ

ගුනදාස කපුගේ නම් මිනිසා පිළිබඳව ලියන්නට ප්‍රමාණවත් තරම් දැනුමක් මා තුළ නැති වුව ද ශ්‍රී ලාංකික සමාජය තුළ තබා ගොස් ඇති ප්‍රතිරූපය පිළිබඳව යමක් පැවසීමට මට අවසර දෙන්න.

කපුගේ නම් අපේ මිනිසා සහ ඔහුගේ ප්‍රතිරූපය බොහෝ විට සමපාත වන්නේ නිර්ධන පන්තිය හා ධනපති විරෝධාකල්පය යන්න රහසක් නොවේ. පීඩකයාට එරෙහිව පීඩිතය වෙනුවෙන් සොඳුරු ගැඹුරු ස්වරයෙන් ඔහු නැගූ රාවය තව යුග ගණනක් සඳා අමරණීය වන බවට විශ්වාසයි. ඔහු



අපෙන් වෙන් වී ගොස් ඇති නමුදු, නිබඳව සෑම තරාතිරමකම යුක්තිය සාධාරණය වෙනුවෙන් කම්පනය වන හදවත් තුළ ඔහු නොමියෙන බව නැවතත් පසක් වූයේ, පසුගිය මැයි 1 වැනිදා පීඩිතයන්ගේ දිනයේ දී ඔහුගේම පුත් මිත්‍ර කපුගේගේ ප්‍රධානත්වයෙන් පැවති ''පීඩකයන්'' නැමැති ගී ප්‍රසංගයට සහභාගී වීමෙනි.

මිත්‍ර වැරනි, කපුගේ යනු සම කළ හැකි හඬක් නොවේ. සමහරවිට මා එසේ පවසන්නේ ඔහු අපගේ සම්පතක් වූ නිසා විය හැකිය. කෙසේ වුවත් මිත්‍රගේ ආගමනය අගය කළ යුතුය. මේ දේ පිළිබඳව මා පවසන්නේ මගේ අදහසයි. මා මිත්‍රගේ හඬ අවතකසේරු නොකරන්නෙමි. එහෙත් ඔහුට තව බොහෝ දුර යාමට තිබේ. කල් ගත වී ඔහු පදම් වනු ඇත. ඔහුට එසේ විය හැක්කේ ගායනය ද, එයින් ජනිත වන දේ හා පෞද්ගලික ජීවිතය හා බද්ධ වුවහොත් සමපාත වුවහොත් පමණක් බවට මතක් කරමි. මන්ද කපුගේ ගැයුවේ වචන පමණක් නොවේ. හුදු වදන් වලින් ඔබ්බට ගිය සංවේදනාද ඔහු අප ඉදිරියේ ගැයූ බව අමතක නොකළ යුතුය

ප්‍රසංගය සංවිධානය කළ ප්‍රසන්න අයියාට අපගේ ගෞරවය හිමි විය යුතුය. මන්ද කපුගේ ඇදහූ දර්ශනය හා දේශපාලනය තුළ ගැවසුනු පුද්ගලයන් බොහෝ දෙනෙකු මේ සමාජයේ සිටියද ඒ දේශපාලනයේ අප නුදුටු ප්‍රසන්න අයියා මෙයට මැදිහත් වීමය. ප්‍රසන්න අයියා කළ දේ අපට කරන්නට නොහැකි වීම ගැන මා ද ඇතුළු බොහෝ දෙනෙකු ලැජ්ජා විය යුතුය. සමස්ථ උත්සවය පිළිබඳ මාගේ අදහස ධනාත්මකය. එහෙත් ප්‍රසංගය අලංකාර කිරීමට යෙදී තිබූ නැටුම් දර්ශන නොතිබුනානම් හොඳය කියා බොහෝ දෙනෙකු අදහස් කළ බවද පැවසිය යුතුය. සංගීතය හා වේදිකා අලංකරනයට මේ සමඟ මල් මිටක්.

## වෛවර්ණ මැයි දිනය

චිකාගෝ වලින් ඇරඹුනු ලෝක කම්කරුවන්ගේ හා ලාංකීය වෘතීය සටන් ඉතිහාසය ගැන දන්න කාලේ ඉඳලා ලියලා කථා කරල මටත් දැන් ඇති වෙලා තියෙන්නේ. අපිත් කිව්වා අපේ අයියලත් කිව්වා. අපේ තාත්තලාත් කිව්ව අපේ කවිකරුවෝ කියන උන් ටික දුවන්නෙම අයාලෙනේ.

මැයි ගැන කථා නොකර ඉන්න හිටියත් මෙදා සැරේ මැයි දිනේ තිබ්බ උනන්දුව නිසාම පොඩ්ඩක් ඇලට් එකේ හිටියේ තාත්තලාත් එක්ක කථා බහ කරලා බැලුවට කිව්වේ දරුවෝ ඇන් ඇම් ලා කොල්වින්ලා හර්තාල් කරපු කාලේවත් නැති උනන්දුවක්නේ. මේ පාර මිනිස්සුන්ට තියෙන්නේ කියලා.” ඊට පස්සේ තාත්තා කියපු “ මුං යන්නේ මැයි දිනේ සමරන්න නෙවෙයි ගාල්ලයි කිරුලපනෙයි පැත්තටයි” කියාල වැඩේත් ඉතිං




ඇත්ත අපි දැක්කනේ සිද්දිය.

යකෝ දැං මැයි දිනේ රතු නෙවෙයි වෛයිවර්න නිල් කොල කහ. රටකට ගිය කලත් කියලා තමයි අපේ තාත්තලා දුක් වෙන්නේ.

මේක නුගත් කම්කරුගේ විතරක් කරන වැඩක් නම් කමක් නැහැ. මෙකේ මූලිකත්වය සටන් ඉතිහාස වලට හිමිකම් කියන කොමියුනිස්ට් සම සමාජ නායකයෝත් ගත්ත එක තමයි වැඩේ. දුකේ හොඳ එක.

හැමදාම කියනවා වගේ කම්කරුවන්ට නායකත්වය දෙන්න පක්ෂයක් අවශ්‍ය තමයි. ඒත් මේ දිනයේදී පෙරට ආ යුත්තේ වෘත්තීය සමිති ව්‍යාපාරය මිසක් පක්ෂ නෙවෙයි. වැඩිය දුක හිතෙන්නේ අපි ධනපති අධිරාජ්‍ය වාදය කියලා හඳුන්වන ඔස්ට්‍රේලියාව වගේ රටක කම්කරුවෝ මැයි දිනේ සමරනා හැටි දැක්කම. මාත් මැයි දින කීප සැරයක්ව බලන්න ගිහින් තියෙනවා. ඒ හැමදාම දැක්කේ සටහන් පාඨ කම්කරු නායකයන්ගේ පොටෝ මිසක් ඇගමැතිගේ ඇමතිලාගේ පොටෝ නෙවෙයි. ආසවට එක දේශපාන නායකයාගේ පින්තූරයක් දැක්කේ නැහැ. කට්ටිය අපූරුවට සටන්පාඨ කියමින් පෙලපාලියේ ගිහින් රැස්වීමක් කරලා විසිරිලා යනවා. අපි ඉතිං හැමදාම බටහිරින් ගත්තේ ගන්න ඕන දේවල් නෙවෙයිනේ

දුක තමයි රංජනි ... කම්කරුවට ලංකාවේ හැමදාම ...

## සසරෙන් මිදීම

සසර දුකින් මිදෙනව කියෙන්නෙ මාරම අභ්‍යාසයක් කියල මේ ලෝකෙට ඔප්පු කරල පෙන්නුවෙ අපි දන්න විදිහටනම් බුදුන් වහන්සේ. ඒක මේ.... කාලේ ගෑණු මිනිස්සු, කොල්ලො කෙල්ලො කරන වහ කනවා හරි ගඟක මුහුදක පනිනව හරි බෙල්ලෙ වැල දා ගන්නවා හරි මේ ලෝකෙන් චුත වෙලා ගිහින් ඉන්න එවුන්ට දුක දෙන එක වගේ



සරල ක්ෂණික කතන්දරයක් නෙමෙයි. අපේ කාලේ මේ පරපුරම හිතන්නේ ජීවිතෙන් සමුගන්න එක තමයි දුකෙන් මිදීම කියලා. ඒක එහෙම නෙමෙයි කියල තේරෙන්නේ දිනපතා මාධ්‍ය දිහා බැලුවහම. ඉතින් මොකද කරන්නෙ

සත්‍ය අවබෝධය කියන්නෙ තම තමන්ගෙ නැණ පමණින් අවබෝධ කරගත යුතු දෙයක්නෙ. අධ්‍යාපනය කියන්නෙ ඒකෙදි තීරණාත්මක සාධකයක් බව ඇත්ත.

මේක ටිකක් අමාරු වැඩක්. ජීවත් වෙලා ඉන්න ගමන් දුකින් මිදෙනවා කියන්නෙ රියල් ගේමක්. එහෙම කට්ටිය වැඩි දුරට ඉන්නෙ සංඝ සමාජයේ කියලයි අපි හිතන්නෙ. ඒකත් එහෙම නෑනෙ.

ඒකනෙ සාමණේර වෙලා උපසම්පදා ලබලා පිරිවෙන් විශ්ව විද්‍යාලවලට ගිහින් ගුරුපත් වීමක් එහෙම අර ගත්තට පස්සෙ සිවුර දෙහි ගහ උඩ වනලා පන්සෙලෙන් මාරු වෙන්නේ බොහෝමයක් උන්නාන්සෙලා. ඒක මහ කට්ට කන පට්ට ගේමක්.

ඒ වගේ දෙවල් වලට නොමේරු අවධියේ දී මුල පුරනවාට වඩා සමාජ අවබෝධය ලබා ගෙන ටිකක කල් ගත වෙලා වැඩේ පටන් ගන්නවා නම් ප්‍රතිඵලදායකයි මට හිතෙන්නේ. එතකොට ආපහු හැරෙන ගතිය අඩුයිනේ.

මං මේ ප්‍රාර්ථනාවක් කියල පටන් ගත්තෙ විශේෂ දෙයක් කියන්න. පහුගිය දවසේ දී බෙරික් පන්සලේදී පැවදි බවට පත් වූ අය ගැන සඳහනක් කළ යුතුය කියා මට හිතුනා. ඇය කාරණා කීපයක් නිසා විශේෂිතයි. ඕස්ට්‍රේලියාවේ දී මෙහෙණි සසුණට ඇතළු වූ පළමු ශ්‍රී ලාංකික කත ඇයයි. ඇය විවාහක දරු මල්ලන් සිටින කාන්තාවක්. ඊට පෙර ඇය නැටුම් ආචාර්යවරියක්. (දරුවන්ට නොමිළේ අධ්‍යාපනය ලබා දුන්) ඕස්ට්‍රේලියාව වගේ සුව පහසු ජීවිතයක් ගත කළ හැකි රටක සියල්ල හැරපියා පැවදි බවට ඇතුලත් වීම එක අතකට විශ්මිත කරුණක්. ඒක සුළු පටු තීරණයක් නොවේ.

ඇගේ ඒ අධිෂ්ඨානයටයි අපි ගරු කළ යුත්තේ

ජීවිතය කියන්නේ හරි පුදුම දෙයක් . ඒ ජීවිතය තුළ අප ගන්නා තීරණ විටෙක හරිම



අපූරුයි. ඇගේ මේ තීරණය ගැන නොයෙකුත් දෙනා හට විවිද අදහස් තිබිය හැකියි. සමහරු මෙය අනුමත නොකරන්නටත් පුළුවන්. බොහෝ දෙනා මේ ගැන දැක්වූ ප්‍රතිචාර ඉතා යහපත් බව කිව යුතුමය. අනුමත නොකළ දෙනාගේ දැනුවත් භාවය සඳහා මතක් කළ යුතු කාරණාව නම් බුදුන් වහන්සේ ද ගිහි කළ විවාහ ජීවිතයක් ගත කළ බවද බිරිඳක් දරුවෙකු සිටිය සැමියෙකු වී සිටි බවත් ඔහු ගිහි ගෙයින් නික්මුනේ ඒ සියල්ල අතැරදමා බවත් එසේ නොවූයේ නම් අද බුදු කෙනෙක් නොමැති බවත්ය. මේ වෙසගේ මේ පුන්‍ය ක්‍රියාව වෙනුවෙන් අපගේ ගෞරවය ඇයට පුද කරනු කැමැත්තෙමු.



සිටියවුන් පැවසු කාරනාවකි. බඩගින්නේ ඉඳගෙන සිංදු කියා බනවත් අහන්න බැරි බැව් ඔබත් දන්නා බව හොඳින් තේරුනා. ඉතින් සිසර මේ අප අස්සේ අපට දැනුන කාරනයකුත් කියන්න හිතුනා.

## සිනාවී

ලංකාවෙන් මෙහේට ඉන්පෝට් කරන ප්‍රවීන සංගීත කරුවන්ගේ සංගීත සන්ධ්‍යාවන් ගොන්නකට මැදිවනු අපේ පුංචි ගායිකාවකගේ සංගිත තැටියක් දොරටවඩින උත්සවයට ගිය සතියේ යන්නට ලැබුනා. ඇය ප්‍රවීන ගීත රචක සිසිර දිසානායකගේ දියනිය වන සරිනි දිසානායකයි.

සිසිර දිසානායක සමග විශේෂ සම්බන්දතාවයක් නොමැති වුවද ඇගේ මේ උත්සවයට යන්නට හිතුනේ, සිසිරගේ නිර්මාණ පිළිබඳව තිබු ඇල්මත් ආධුනික ගායිකාවට දෙන සහයක් ලෙසත්. දශක ගනනාවක් තිස්සේ අපට හුරු පුරුදු ගීත නැවත නැවත ඇසීමට ඇති නොකැමැත්ත නිසාත්මය.

අවකංවට කිවහොත් මගේ ඒ බලාපොරොත්තුව ඒ අයුරින් ම ඉටුවුනා යැයි කිවහොත් නිවැරදිය. මා එය පවසන්නේ හදවතින්මයි. එය අරම්භ වූයේ ප්‍රසංගය නියමිත වේලාවට ආරම්භ කිරිම තුළින්මයි. අපට නුහුරු එහෙත් ප්‍රශස්ථ නිවේදකයකුගේ මෙහෙයවිම යටතේ ප්‍රසංගය තමා හා තම දියනියගේ පමනක් නොකර තවත් දක්ෂ දරුවන් කීපදෙනෙකුට අවස්ථාව ලබා දීම පැසසිය යුතුමයි. විවේක කාලයේ ලබා දුන් ( නොමිලේ ) ආහාර පාන බොක්කටම වැදුනු බව නම් පැමින

මෙහෙමයි. ඇයට විශාල ගායන පරාසයක් තියෙන බව ඇත්ත. ඒත් අර අනුන්ගේ ගීත නොකියා ඇගේම ගීත කීපයක් කිව්වා නම් අගෙයි කියලා හිතුනා. අනෙක් කාරනේ ඇයට වේග රිද්මය අගේට ගැලපෙන බව පේනවා. මේ සීඩී එකේ ඇගේ හිට් කල හැකි ගීත ගනනාවක්ම තියෙනවා. ඒක මෙහේ රසිකයෝ මෙන්ම ලංකාවේ කට්ටයටද කරන සාධාරනයක්. අවසන් වශයෙන් සිසිරටත් ඔහුගේ දියනියගේ ගායනා දිවියටත් සුභ පතමි. මන්ද සිනාවී සිනාවීගෙන බලන්න හැකි ප්‍රංගයක් බවට පත් කලාට.

## ගෙදර යන ගමන

ඇමරිකාවෙ බැරුක් ඔබාමා ගැන අපූරු ප්‍රවෘත්තියක් පහුගියදාක රූපවාහිනියක දැක්කා. වාර දෙකක් ජනාධිපතිකම කරලා ඔබාමා දැන් ගෙදර යන්නයි ලෑස්තිය. ලෝකේ බලවත්ම රාජ්‍යයේ ජනාධිපතිකම වසර දෙකක් දරනවා කියන්නෙ කොයි තරම් ආශ්වාදජනක සහ බැරෑරුම් කටයුත්තක්ද? ඇමරිකානු ව්‍යවස්ථාව අනුව දෙවතාවකට වඩා එක දිගට ජනාධීපතිකම කරන්න අවසරයක් නැහැ. ඒ නිසා දැන් ඔබාමා ගෙදර යා යුතුමයි. (ව්‍යවස්ථාව වෙනස් කරගෙන තවත් වාරයක්වත් බලයේ ඉන්න මේ මිනිස්සුන්ට නොහිතෙන්නෙ මොකද මන්දා)



ඔබාමා දැන් ජනාධිපති දිවියේ සිට සාමාන්‍ය ජීවිතයට සංක්‍රමණය වන්නට පුහුණු වන බවක් තමයි ප්‍රවෘතියෙන් කියවුණේ. ජීවිතයේ එදිනෙදා සාමාන්‍ය කටයුතු මෙන්ම සිය වාහනය පැදවීමේ වගකීමත් ඔහුට දරාගන්න වෙනවා. ඒ නිසා සිය වාහන පැදවීමේ බලපත්‍රය අලුත් කරගන්නත් ඔහුට සිදුවෙනවා. ඔහු සිනාමුසු මුහුණින් මේ සියල්ල කරන හැටි බලා වීට්ද්දි මට මතක් වුණේම අම්මපා අපේ ලංකාව.

අපේ මිනිස්සු කුජීත වෙන්නම පැරදිලත් දාලා යන්න බැරුව දඟලන දැඟලිල්ල දකින කොට ඇතිවෙන්නෙ මහා අප්පිරියාවක් අප්පා. මොන මගුලක් කරලා හරි ආයෙම බලය ඩැහැගන්න මේ අපකීර්තිමත් මිනිස්සු දඟලන හැටි දකිනකොට අධිරාජ්‍යවාදීන්ය කියලා අපි තිස්ස දෙවේලෙ බණින ඇමරිකන්කාරයෝ දෙවි දේවතාවන් වගේ නේද කියලත් හිතෙනවා.

ඇමරිකන්කාරයාට තෘෂ්ණාව නැති කරගන්න පුලුවන්. බුදු බණ ඉහේ තියන් අදහන අපේ රටේ නායකයන්ට තෘෂ්ණාව නැති කරගන්න බැහැ. පිස්සු හැදෙනවා දොරේ...

චූටි මල්ලි